# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,690 - 2010 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2011.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 892 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 892 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

49 - B 80190—2,200 (2011/01)
D 1 -

# විවිධ දැන්වීම්

## ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම

සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

ජේ. ආර්. පී. සූරියප්පෙරුම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ආචාර්ය මාලිනී ෆොන්සේකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) ශ්‍රී ලංකාවේ ළමා හා කාන්තා අභිවෘද්ධිය, සමාජීය, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් ඔස්සේ ඇතිකරලීම.

. (ආ) ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සකලවිධ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම.

යනාදිය වේ.

ජේ. ආර්. පී. සූරියප්පෙරුම,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

01-503

---

## හිස්බුල්ලා පදනම

සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

හුනෙයිස් ෆාරුක් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "හිස්බුල්ලා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි", යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි.

(අ) ජනතාවගේ සදාචාරාත්මක හා සංස්කෘතික අගයන් සුරැකීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම

යනාදිය වේ.

හුනෙයිස් ෆාරුක්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.
වන්නි දිස්ත්‍රික්කය.

01-505

## අල්මනාර් විදුහල් ව්‍යවස්ථාව

සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

හුනෙයිස් ෆාරුක් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "අල්මනාර් විදුහල් ව්‍යවස්ථාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි," යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) රජයේ පාසල්වල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපන උවමනා ඉටුකිරීම.

යනාදිය වේ.

හුනෙයිස් ෆාරුක්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.
වන්නි දිස්ත්‍රික්කය.

01-506

---

## පූජ්‍ය තපෝවනයේ රතන හිමි බෞද්ධ සමාජ සුහසාධන පදනම

සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

ශෙහාන් සේමසිංහ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "පූජ්‍ය තපෝවනයේ රතන හිමි බෞද්ධ සමාජ සුහසාධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි", යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) දේශීය ඖෂධ ක්‍රමය සහ ඖෂධ භාවිතයෙන් සත්වයන්ට සත්ව ආරෝග්‍ය ශාලාවක් ආරක්ෂා කිරීම සහ ගවයන් ආදී සතුන්ට අභය දානය දීම, ඔවුන්ට සුදුසු නිරුපද්‍රිත වාසස්ථානයක් ආරම්භ කිරීම, රැකබලා ගැනීම සහ ඔවුන් නඩත්තු කිරීම.

යනාදිය වේ.

ශෙහාන් සේමසිංහ,
පාර්ලිමේන්තු මන්ත්‍රී.
අනුරාධපුර දිස්ත්‍රික්කය.

01-504

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.